A

**නිවේදනය**

අඹතැන්න, බොල්ලේගොඩ, අංක 1/36 යන ලිපිනයෙහි පදිංචි ජී.ජී.ටී.පී. උදයසිරි මහතාගේ දරුවා ආදි ශිෂ්‍ය ගණය යටතේ කඩඉම් ලකුණු 58ක් ලබා ගත් නමුත් මහ/ධර්මරාජ විද්‍යාලයේ 2015 වසරේදී පළමු වසරට ඇතුළත් කර නොගැනීම සම්බන්ධයෙන් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වෙත කරන ලද පැමිණිල්ල විමර්ශනය කරමින් මෙහිදී පැමිණිලිකරුට අගතියක් සිදුව ඇති බැවින් විදුහල්පතිගේ රාජකාරි බලතලවලට අනුව අගතියට පත් දරුවා පාසලට ඇතුලත් කර ගන්නා ලෙසට ඔහු විසින් කරනු ලැබූ නිර්දේශය විදුහල්පති විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කිරීමෙන් පසු ප්‍රතික්ෂේප කර ඇති බැවින් පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) විසින් 1994 අංක 26 දරන පනතින් සංශෝධිත 1981 අංක 17 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනතේ 17(3) (ඇ) වගන්තිය යටතේ නිරීක්ෂණය සහ අවධානයටත්, වැඩිදුර කටයුතු සඳහාත් මා වෙත වාර්තාවක් එවා ඇති බව දන්වනු කැමැත්තෙමි.